

# සයුරේ ජීවී පැවැත්මට නාගරික සංවර්ධන අධිකාරිය දායක වන්නේ කෙසේද?

1978 දී පිහිටු වු නාගරික සංවර්ධන අධිකාරිය එහි සැලසුම් බල ප්‍රදේශයක් ලෙස දිවයින වටා රට තුළට කි. මී. 01 ක බිම් තීරුවක් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව



මෙහි කෙරෙන සියලුම සංවර්ධන කාර්යයන් විධිමත්ව හා සැලසුම් සහගතව කළ යුතුය යන්න නීතියේ සඳහන්වේ.

ශ්‍රී ලංකාවේ අධික ජනගහණයකින් යුත් නගර බොහෝමයක් පිහිටා ඇත්තේ ඉහත ප්‍රකාශයට පත් කරන ලද වෙරළ සීමාව තුළයි. කොළඹ, දෙහිවල - ගල්කිස්ස, මොරටුව, මීගමුව, පුත්තලම, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට, මාතර හා ගාල්ල ඒ අතර ප්‍රධාන තැනක් ගනී. එසේම මීගමුවේ සිට ගාල්ල දක්වා නිරිත දිග හා බටහිර වෙරළ තීරය සංචාරක කර්මාන්ත හා ධීවර කටයුතු සඳහා අධික ඉල්ලුමක් පවතින ප්‍රදේශයකි.



මෙම නගර බොහොමයක අපද්‍රව්‍ය දැනුවත්ව හා නොදැනුවත්ව මුහුදට ගලා බසී. එසේම, කාර්මික ප්‍රදේශ වලින් පිටවන අපද්‍රව්‍ය සහිත පිරිසිදු නොකළ ජලය මුදා හරින්නේ ද අසල ඇති ගංගා හා ඇල මාර්ග වලටය. අවසානයේ එවා මුහුදට එක් වේ.

නගර වල අධික මහල් ගණනින් යුතුව තැනෙන මහා මන්දිර හා මංමාවත් සඳහා ගංගා හාරා ගන්නා වැලි නිසා වෙරළට වැලි හිඟ වේ. සමහරවිට වෙරළේ ආරක්ෂාවට ඇති වැලි වැටිද ඉදිකිරීම් සඳහා භාවිතකෙරේ. හුණු සැපයුමට ඇති විකල්ප අල්ප බැවින්,කොරල් පර සිදිනු ලැබේ.

උග්‍ර විරැකියාවට විසඳුම් ලෙස සුරතල් මසුන් ඇල්ලීමේ සිට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය දක්වාත් නීති විරෝධි රැකියා සඳහා හොරෙන් විදේශගත වීම සඳහාත් නාගරික ප්‍රදේශ වලට මුහුද වටිනාකමක් එක් කර ඇත.


එසේ වුවත්, අපගේ අසීමිත ආහාර සම්පත වූ මුහුද මෙවන් අමානුෂික කෙනෙහිලිකම් මැද ද තවමත් අපට නොඅඩුව සේවය සලසයි.


එබැවින්, මේ සජීවී සයුර සජීවීව තවදුරටත් රැකීම සඳහා සැලසුම්කරුවන් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූදර්ශන අංශයෙන් කෙරෙන වැඩ කටයුතු සමහරක් ගැන මෙහිදී සොයා බලමු.

**01.** කලාපකරණ හා සැලසුම් මගින් ඉඩම් භාවිතය සම්බන්ධයෙන් ගන්නා වැදගත් තීරණයන්ට පළාත් පාලන ආයතන වලට මග පෙන්වීමක් කරයි. ඒ අනුව, වෙරළට ආසන්නයේ පිහිටි කඩොලාන පද්ධතිය කලපු හා වැලි තීරු සංරක්ෂණය සඳහා වෙන් කෙරේ. තවද පුද්ගලික ආයෝජන සඳහා යෝජනා වන දහසකුත් යෝජනා අතරින් සුදුසුම යෝජනා තෝරා ගැනීමටත් සහායවේ. එමගින් වෙරළ පරිසරයට හෝ මුහුදට අපද්‍රව්‍ය එක් නොවීමට වගබලා ගත හැකි වේ. මහා පරිමාණ වරාය සංවර්ධන කටයුතු හා ඊට අදාළ පහසුකම් සැපයීමේ දී වෙරළ හා ඊට යාබද ඉඩම් කොටස් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

උදා : කොළඹ වරාය, හම්බන්තොට, ඔළුවිල් වරායන්ට අවශ්‍ය ඉඩ පහසුකම් සැපයීමට අදාළ ඉඩම් පරිභෝග සැලසුම් කටයුතු සැකසීම.


**02.** තදබද වී කාර්ය බහුල දිවියක් ගෙවන අපේ මිනිසුන්ට විවේකයක් හා සිසිල් සුළං පොදක ආශ්වාදය ලැබීමට මුහුද අසළට යාමට ඇති අයිතිය අද අහිමිවෙමින් පවතී.





### පානදුර වෙරළ උද්‍යානය

එක්කෝ වෙරළ අනාරක්ෂිතය. නොඑසේ නම් අප්‍රසන්න වන පරිදි කැළිකසල හා අනෙකුත් කුණු රොඩු වලින් ගහණය. එසේ වුවත් මුහුදට ප්‍රිය කරන්නන්ගේ අඩුවක් නොමැත. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය අදාල




පළාත් පාලන ආයතන සමඟ පොදු ජනයාගේ සුවපහසුව සඳහා මුහුදු බඩ උද්‍යාන සැලසුම් කිරීම හා නිර්මාණය කිරීමට දායක වේ. ගාලු මුවදොර පිටිය යළි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේ සිට මීගමුව (ඒත්තුකාල), වැල්ලවත්ත, කාකදූපත, හලාවත, මඩකලපුව(කස්ටම්පාර)

**03**. ගමින් නගරයට ඇදෙන බොහොමයක් දුප්පතුන් හට ක්ෂණික නවාතැන් සපයන්නේ වෙරළයි. වෙරළේ අනවසර ඉදිකිරීම් ලෙස අප දකින සමාජ ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට බොහෝ කලක සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙරල සංරක්ෂණදෙපාර්තමේන්තුව හා අනෙක් පළාත් පාලන ආයතන සමඟ දිගින් දිගටම වැඩ කටයුතු කර ගෙන යයි. මේ මගින් වෙරළ අපවිත්‍රවීම වළක්වන අතරණී මුහුදු බාදනයෙන් නිවැසියන්ට වන හානිය ද වළක්වා ගැනේ. විකල්ප නිවාස යෝජනා ක්‍රම වෙත ධීවර නොවන පදිංචිකරුවන් යොමු කරයි. තාවකාලික පහසුකම් රහිත පැල්පත් හා මුඩුක්කු ඉවත් කිරීමට ද කටයුතු යෙදේ.


උදා: වැල්ලවත්ත, කාක දූපත, මොරටුව (නව ගාලුපාර)


**04**. අපේ මුහුදින් සැපයෙන ආහාර වලට වැඩිමනත් ලෙස මුහුද හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් සොබාදහම නිමැවු හා මිනිස් අතින් නිමැවු දහසකුත් එකක් දසුන් සංරක්ෂණයට ද දායකත්වය සැපයේ.

උදා: හුම්මානය සංරක්ෂණ ව්‍යාපෘතිය ගාලු කොටුව සංරක්ෂණය.




**කලාපකරණ සැලැස්ම - 2010 කොළඹ**




**කාකා දූපත පවතින තත්වය හා යෝජිත සැලැස්ම**

**පානදුර, කළුතර, මාතර, වැලිගම, හම්බන්තොට හා බේරුවල වෙරළ තීරු සඳහාද සැලසුම් නිම වී ඇත.**

මේවායේ ඇති ආර්ථික වටිනාකම පමණක් උකහා ගැනීමට විවිධ පුද්ගලයින් හා ආයතන දරණ උත්සාහයන්ට එරෙහි වෙමින් පොදු ජන සුබ සෙත සඳහා පළාත් පාලන ආයතන මගින් ඒවායේ පරිසර සුන්දරත්වය හා ගුණය රැකෙන පරිදි කටයුතු කිරීමටත් ආදායම් උපයා ගැනීමටත් නාගරික සංවර්ධන අධිකාරිය මඟ පෙන්වනු ලැබේ.

මේ සියල්ලෙන් රටේ ජනතාවට මළ මුහුදක් නොවන සජීවී මුහුදක් රැකදීමටත්, නාගරික සංවර්ධනය විධිමත් කිරීමටත් කටයුතු සම්පාදනය කෙරේ.

**කේ. ඒ. ඩී. චන්ද්‍රදාස, නියෝජ්‍ය අධ්‍යක්ෂ,**
**පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය**